නියෝග අංක 16

පනතේ 25(1) වගන්තිය යටතේ තොරතුරු ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර RTI 05 දරණ දැන්වීම අයදුම්කරු වෙත යවනු ලබන සෑම තොරතුරු නිලධාරියෙක්ම එකී ප්‍රතික්ෂේප කිරීම හා ඊට අදාළ වන ඉදිරි ක්‍රියාමාර්ග ගැන සටහන් තැබෙන පරිදි පහත දැක්වෙන RTI 11 දරන ආකෘතියට අනුව ප්‍රතික්ෂේප කිරීම් පිළිබඳ විස්තර ලේඛණයක් පවත්වාගෙන යා යුතුය.

නියෝග අංක 17

01. තොරතුරු සැපයීම වෙනුවෙන් අයකෙරෙන ගාස්තු. ගිණුම් තැබීම,

පොදු අධිකාරියක් විසින්ම,

පනතේ විධිවිධාන පරිදි තොරතුරු සැපයීම වෙනුවෙන් ගෙවන ලද ගාස්තු සඳහා රිසිට්පතක් අයදුම්කරුට නිකුත් කළ යුතුය. අයකරන ලද ගාස්තු පිළිබඳව පහත දැක්වෙන විස්තර අඩංගු ලේඛණයක් පවත්වාගෙන යා යුතුය.

අයදුම්පතේ ලි.ප.අංකය හි දිනය

අයදුම්කරුගේ නම හා ලිපිනය

ගෙවන ලද ගාස්තුව රු.

නිකුත් කල රිසිට්පත් අංකය, දිනය

02. ඉහත පරිදි අයකරනු ලබන ගාස්තු රජයේ හෝ අර්ධ රාජ්‍ය ආයතන සම්බන්ධයෙන් ආදායම් ගිණුම්වල විවිධ ලැබීම් ශීර්ෂයන්ට බැර කළ යුතුය.

03. පනතේ 15 (ළ) උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ නියමයට අනුව පුරවැසියකුගෙන් අයකරනු ලැබූ ගාස්තු ප්‍රතිපූර්ණය කිරීමකදී අදාළ පිරිවැය රජයේ හෝ අර්ධරාජ්‍ය ආයතන සම්බන්ධයෙන් වන කල්හි ගිණුම්වල විවිධ ගෙවීම් ශීර්ෂයන්ට හරකර ගෙවීම් කළ යුතුයි.

නියෝග අංක 18

*තොරතුරු නිලධාරීන් හා නම්කළ නිලධාරී විස්තර වාර්තා කිරීම*

පනතේ 23 වන වගන්තිය පරිදි රාජ්‍ය අංශයේ සෑම පොදු අධිකාරියක් විසින්ම පත් කරනු ලබන තොරතුරු නිලධරයන් සහ නම්කළ නිලධාරියා පිළිබඳ පහත දක්වෙන RTI 12 දරණ ආකෘති පත්‍රය මගින් ජනමාධ්‍ය විෂයය භාර අමාත්‍යාංශය වෙත වාර්තා කළ යුතුය. එකී නිලධාරීන් වෙනස්වන සෑම අවස්ථාවකම ඒ වෙනුවට පත්කරන ලද නිලධාරීන් පිළිබඳ විස්තර එසේ පත්කරනු ලබන අවස්ථාවේදී අමාත්‍යාංශයට වාර්තා කළ යුතුය. මේ පිළිබඳව ලියාපදිංචි ලේඛනයක් ජනමාධ්‍ය අමාත්‍යාංශය පවත්වාගෙන යා යුතුය.

නියෝග අංක 19

i. පනත යටතේ පොදු අධිකාරියක් විසින් හෙළිදරව් කරනු ලබන සියලුම තොරතුරු ගාස්තු රහිතව කාල නියමයකින් තොරව අවසර ලබා ගැනීමකින් තොරව නැවත භාවිතයට ගැනීමට හිමිකම තිබේ.

ii. ඉහත i උපවගන්තිය යටතේ නැවත භාවිතා කිරීම යන්නෙන්, පිටපත් කිරීම ප්‍රකාශයට පත් කිරීම, පරිවර්තනය කිරීම, බෙදා හැරීම, භාවිතයට ගැනීම හෝ වෙනත් ආකාරයකින් වෙනත් මාධ්‍යකින් වෙනත් ආකෘතියකින් නීතියට අනුකූල වන්නා වූ අරමුණ සඳහා භාවිතා කිරීම අදහස් වන්නේය.

නියෝග අංක 20

*ප්‍රගාමී තොරතුරු ප්‍රකාශයට පත් කිරීම*

01. පනතේ 15 (ඇ) වගන්තියෙහි විධිවිධාන පරිදි සෑම පොදු අධිකාරියක් විසින්ම අවම වශයෙන් පහත සඳහන් තොරතුරු විද්‍යුත් හෝ තාක්ෂණික ආකෘතියකින් ප්‍රකාශයට පත් කළ යුතුය.

I. ආයතනික තොරතුරු - ආයතනයෙහි නෛතික පදනම, අභ්‍යන්තර රෙගුලාසි, කාර්යයන් හා බලතල
II. සංවිධාන තොරතුරු - විධායක තනතුරු දරන්නන්ගේ නම් තනතුරු ඔවුන් සම්බන්ධ කරගත හැකි තොරතුරු, ඔවුන්ගේ වැටුප් පරිමාණ හා දීමනා ඇතුලුව සංවිධාන ව්‍යුහය.
III. මෙහෙයුම් තොරතුරු -ප්‍රතිපත්ති, සැලසුම්, සහ උපාය මාර්ග, ක්‍රියාකාරකම්, කාර්යය පටිපාටි, වාර්තා සහ ඇගයීම් තොරතුරු හා ඒවාට පදනම් කරගත් දත්ත හා තොරතුරු සහිතව
IV. තීරණ හා ක්‍රියාකාරකම් - තීරණ හා විශේෂයෙන්ම පොදු ජනතාවට බලපාන සේ ගත් ක්‍රියාමාර්ග හා ඒවාට පදනම් කරගත් දත්ත හා ලියවිලි සමඟ
V. මහජන සේවා තොරතුරු - පොදු මහජනතාවට ලබා දෙන ලද සේවාවන්, ඊට අදාළව නිකුත් කර ඇති උපදෙස්, පොත්, පත්‍රිකා, ආකෘති පත්‍ර, ගාස්තු හා ඒවාට අදාළ කාල පරාසයන්
VI. අයවැය තොරතුරු -අපේක්ෂිත අයවැය

සත්‍ය වියදම් හා ආදායම්, වෙනත් මූල්‍ය තොරතුරු හා විගණන වාර්තා ( විධායක ශ්‍රේණි හා ඊට ඉහළ නිලධාරීන්ගේ වැටුප් පරිමාණයන් හා දීමනා සහිතව )

VII. විවෘත රැස්වීම් තොරතුරු - විවෘත රැස්වීම් තොරතුරු හා ඒවාට සම්බන්ධ විය හැකි ආකාරය
VIII. තීරණ - තීරණ ගැනීමේ ක්‍රියාවලිය, මහජන සහභාගීත්වය ලබා ගනු ලබන ආකාරය, තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහිදී මහජනයා සමඟ කෙරෙන සන්නිවේදනය හා ඒ සඳහා ඇති යාන්ත්‍රණය
IX. සහනාධාර තොරතුරු- සහනාධාර හා සම්බන්ධයෙන් දෙනු ලබන සහනාධාර, ප්‍රතිලාභීන්, අරමුණු වැය කරන මුදල් හා ක්‍රියාත්මක කිරීම
X ප්‍රසම්පාදන තොරතුරු - ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව කාර්යය පටිපාටිය, නිර්ණායක, ගන්නා ලද තීරණ, ටෙන්ඩර් අයඳුම්පත් භාර ගැනීම, ගිවිසුම් පිටපත්, ගෙවුම් වාර්තා, කොන්ත්‍රාත් සම්පූර්ණ කිරීම ඇතුලු විස්තරාත්මක තොරතුරු
XI ලැයිස්තු, ලේඛන හා දත්ත තොරතුරු - ලැයිස්තු, පොදු අධිකාරිය තබාගෙන ඇති දත්ත තොරතුරු, ඔන්ලයින් මඟින් හෝ ඔන්සයිට් මඟින් මහජනයාට ප්‍රවේශ විය හැකි ලැයිස්තු, ලේඛන, දත්ත
XII. පවත්වාගෙනු ලබන තොරතුරු පිළිබඳ තොරතුරු - තබාගෙන ඇති ලියවිලි, දත්ත තොරතුරු හා ඒවායෙහි අඩංගු තොරතුරු ඇතුලත් නාමාවලිය
XIII. ප්‍රකාශන තොරතුරු - නිකුත් කර ඇති ප්‍රකාශනයන් සම්බන්ධයෙන් තොරතුරු හා ඒවා නොමිලයේ හෝ මුදල් ගෙවා ලබාගත යුතුනම් ඒවායෙහි මිල
XIV. තොරතුරු අයිතිවාසිකම පිළිබඳ තොරතුරු - තොරතුරුවලට ප්‍රවේශවීම පිළිබඳ තොරතුරු, තොරතුරු ඉල්ලා සිටිය හැකි ආකාරය, ඒ සඳහා ආයතනයෙහි සම්බන්ධ කරගත හැකි පුද්ගලයින් හා ඔවුන් සම්බන්ධ කරගත හැකි ආකාරය
XV. හෙළිදරව් කරන තොරතුරු - අන්‍යයන්ගේ අවධානයට වැදගත්වන ඉල්ලීමක් මත හෙළිදරව් කරනු ලබන තොරතුරු
XVI. මහජනයාට බලපානු ලබන තීරණ හා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී අදාල වන්නා වූ සියලුම තොරතුරු හා කරුණු ඉහත සඳහන් තොරතුරු ප්‍රකාශ කිරීමේදී අන්තර්ගත කළ යුතුය

02. ඉහත 01වන වගන්තිය යටතේ ලැයිස්තු ගත කර ඇති කරුණු වලට අමතරව, පනතේ 8 වන වගන්ති අනුව ප්‍රකාශිත වාර්තාවල ඇතුළත් වන මහජනයාට ප්‍රයෝජනවත් විය හැකි තොරතුරු ඔවුනට ලබාගත හැකිවන සේ අන්තර්ගත කල යුතුය.

03 . සෑම පොදු අධිකාරියක්ම ඉහත සඳහන් සෑම තොරතුරක්ම වරින්වර යාවත්කාලීන කළ යුතුය.

04. පනතේ 7, 8, 9 හා 10 වගන්තිවල විධිවිධාන යටතේ ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීමට අදාලව යම් පොදු අධිකාරියක් විසින් ප්‍රකාශයට පත් කර ඇති තොරතුරු සාවද්‍ය හෝ ව්‍යාජ හෝ යාවත්කාලීන නොවන බව හෝ යම් පුරවැසියෙකුට ඒත්තු යන්නේ නම් අදාල පොදු අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා වෙත පැමිණිලි කළ හැකිය. පොදු අධිකාරියෙහි ප්‍රධාන විධායක නිලධාරියා එකී තොරතුරු නිවැරදි කිරීමට පියවර නොගන්නේ නම් මාස 3 ක් ඇතුළත තොරතුරු කොමිෂන් සභාවට නිශ්චිත හේතු දක්වමින් අයඳුම්පතක් ඉදිරිපත් කළ හැකිය.

05. ඉහත කරුණ ගැන පරීක්ෂණයක් කර දක්වා ඇති හේතු සාධාරණ වන්නේ නම්, එකී තොරතුරු නිවැරදි කර මාසයක් ඇතුලත වාර්තා කරන ලෙස කොමිෂන් සභාව විසින් පොදු අධිකාරියට විධාන කල හැක්කේය.

06. ඉහත විධිවිධාන පරිදි කරන ලද පරීක්ෂණ හා ගන්නා ලද පශ්චාත් පියවර ගැන විස්තර පනතේ 37 වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට හා ජනාධිපතිවරයා වෙත යැවීමට නියමිත වාර්තාවේ අන්තර්ගත කළ හැකිය.